**MANJULA BALASOORIYA.**
*Attorney – at –Law*
*No. 41,*
*2nd Floor,*
*Belment Street,*
*Colombo 12.*
*Tel: 0714 853653*

---

**ලියාපදිංචි තැපෑලෙනි.**

2025.09.22

නීතිඥ සංඛ කරුණාරත්න
53/3B,
ආර්.ජී. සේනානායක මාවත (ග්‍රෙගරි පාර),
කොළඹ 7.

මහත්මයාණෙනි,

**ඔබගේ 2025 සැප්තැම්බර් මස 10 වන දින දරණ එන්තරවාසිය හා බැඳේ**

1. මාගේ සේවාදායකයා වන පන්නිපිටිය, කළල්ගොඩ, රණවකවත්ත පාර, වී. අයි .පී කෝට්, අංක 464/20 හි පදිංචි සුනිල් වටගල යන අයගේ උපදෙස් මත ඔබ වෙත මෙසේ ලියා දන්වමි.

2. මා හට ලැබී ඇති උපදෙස් අනුව, මාගේ සේවාදායකයා නීතිඥයෙකු වන අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ලබා ඇති බවයි.

3. මා හට ලැබී ඇති උපදෙස් අනුව, මාගේ සේවාදායකයා ජනතා විමුක්ති පෙරමුණේ (JVP) මධ්‍යම කාරක සභිකයෙකු සහ ජාතික ජන බලවේගයේ (NPP) විධායක කමිටු සාමාජිකයෙකු ලෙස දේශපාලන කටයුතුවල නියැලෙන අතර, 2024 මහ මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වූ බවයි.

4. මාගේ සේවාදායකයා වර්තමානයේ මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අතර, තිඹිරිගස්යාය සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජනය කරමින් එහි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාද වශයෙන්ද කටයුතු කරන බවයි.

5. මා හට ලැබී ඇති උපදෙස් අනුව, ඔහු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව , ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය, ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව යන අමාත්‍යාංශීය උපදේශක කාරක සභාවල සහ විශේෂ කාරක සභාවල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

6. මාගේ සේවාදායකයා රටේ මත්ද්‍රව්‍ය ජාල සහ එයට සම්බන්ධය පාර්ශවයන් පිළිබඳ මහජන අවධානය යොමු කිරීමට ද මත්ද්‍රව්‍ය උවදුරෙන් රට මුදා ගැනීමට කැපවී නායකත්වය ගෙන කටයුතු කරන අයෙකි.

7. මාගේ සේවාදායකයාගේ උපදෙස් මත ඔබ වෙත දන්වා සිටින්නේ, 2025.09.10 දිනැති ඔබගේ එන්තරවාසිය ඔහු වෙත ලැබී ඇති බවත්, එම එන්තරවාසියේ අන්තර්ගතය තුලින් පිළිබිඹු වන්නේ ඔබගේ සේවාදායකයා වන නාමල් රාජපක්ෂ මහතාට එරෙහිව, මාගේ සේවාදායකයා විසින් 2025.09.06 හෝ ආසන්න දිනයකදී මාධ්‍ය සාකච්ඡාවකදී සිදු කළ ප්‍රකාශයන් අපහාසාත්මක බවට චෝදනා කර ඇති බවයි. මාගේ සේවාදායකයාගේ උපදෙස් මත දන්වා සිටින්නේ, එකී එන්තරවාසියේ සියලු කරුණු එක්ව සහ වෙන් වෙන්ව මාගේ සේවාදායකයා ප්‍රතික්ෂේප කර සිටින බවයි.

8. මාගේ සේවාදායකයාගේ උපදෙස් මත ඔබ වෙත දන්වා සිටින්නේ, මාගේ සේවාදායකයා විසින් කිසිදු අපහාසාත්මක ප්‍රකාශයක් සිදු කර නොමැති බවයි.



Scanned with CamScanner

9. වැඩිදුරටත් මා වෙත ලැබී ඇති උපදෙස් මත ප්‍රකාශ කර සිටින්නේ, ඔබගේ සේවාදායකයා ඔබ එවන ලද ලිපියෙ දක්වා ඇති ආකාරයේ කීර්තියක් සහිත පුද්ගලයෙකු නොවන බවත්, මෙ වනවිටත් ඔහුට එරෙහිව නීතිපතිවරයා විසින් ක්‍රිෂ් ගණුදෙනුවේ දී රුපියල් මිලියන 70ක මුදලක් සාපරාදී සාවද්‍ය පරිහරණය සඳහා අධි චෝදනා ගොනු කර ඇති බවත්[1], මුදල් විශුද්ධිකරණ චෝදනා[2], නීති විභාගයේ අක්‍රමිකතා[3], සහ රාජපක්ෂ පවුලේ දූෂණ චෝදනා යන විවිධ ආන්දෝලනයන් මත පදනම්ව ඔබගේ සේවාදායකයාගේ සමාජය හමුවේ අපකීර්තියට පත් ව ඇති අයෙකු බවයි.

10. මාගේ සේවාදායකයාගේ උපදෙස් මත ඔබ වෙත දන්වා සිටින්නේ, ඉහත සඳහන් කරුණු මත පදනම්ව, ඔබගේ සේවාදායකයා කීර්තියක් නොමැති පුද්ගලයෙක් බවත්, එබැවින් මගේ සේවාදායකයා සිදු කර ඇති කිසිදු ප්‍රකාශයකින් ඔහුගේ කීර්ති නාමයට හානියක් සිදු වී නොමැති බවයි.

11. මාගේ සේවාදායකයාගේ උපදෙස් මත ඔබ වෙත දන්වා සිටින්නේ, මාගේ සේවාදායකයාගේ ප්‍රකාශයන් අපහාසාත්මක හෝ ද්වේශසහගත නොවන බවත්, එම ප්‍රකාශයන් පොදු මහජන අවකාශයේ සංසරණය වන තොරතුරු, වාර්තා, මාධ්‍ය සහ සමාජ ජාලා වාර්තා මත පදනම්ව, කරනු ලැබූ ප්‍රකාශයක් බවත් ය.

12. මාගේ සේවාදායකයාගේ උපදෙස් මත ඔබ වෙත දන්වා සිටින්නේ, මාගේ සේවාදායකයාගේ ප්‍රකාශයන් මහජන යහපත සඳහා මහජන අවකාශය තුල තිබෙන්නාවූ තොරතුරු මත පදනම්ව සද්භාවයෙන් කරන ලද ප්‍රකාශයක් වන බවත්, එම ප්‍රකාශයන්හි කිසිදු ද්වේශසහගත අරමුණකින් ප්‍රකාශ කර නොමැති බවත්ය

13. මා වෙත ලැබී ඇති උපදෙස් මත ප්‍රකාශ කර සිටින්නේ, ඔබගේ 2025 සැප්තැම්බර් මස 10 වන දින දරණ එන්තරවාසියේ ඉල්ලීම් සියල්ල ප්‍රතික්ෂේප කරන බවත්, සමාව අයැදීමක් හෝ රුපියල් බිලියන 1ක වන්දි ගෙවීමක් මාගේ සේවාදායකයා සිදු නොකෙරෙන බවයි. වැඩිදුරටත් මා වෙත ලැබී ඇති උපදෙස් මත දන්වා සිටින්නේ, එන්තරවාසිය පදනම්ව ඔබ විසින් නඩු පැවරුවහොත්, එයට එරෙහිව විත්තිවාචික ගොනු කරන බවත්, එයට අදාල හරස් ඉල්ලීම් සහිතව නඩුව හබ කරන බවත්, එම නීති කෘත්‍යයන්ට අදාල සියලු නඩු ගාස්තු ඔබගේ සේවාදායකයාගෙන් අය ගැනීමට මාගේ සේවාදායකයා අධිකරණයෙන් අයදිනු ඇති බවත්ය.

14. මා වෙත ලැබී ඇති උපදෙස් මත වැඩිමනත් වශයෙන් දන්වා සිටින්නේ, ඔබගේ 2025 සැප්තැම්බර් මස 10 වන දින දරණ එන්තරවාසිය පදනම්ව, ඔබගේ සේවාදායකයා විසින් හෝ ඔහුගේ නියෝජිතයින් සහ/හෝ ඔහුගේ ප්‍රකට හෝ අප්‍රකාශිත අනුදැනුම සහ අවසරය යටතේ කටයුතු කරන්නන් විසින් මෙම එන්තරවාසි ලිපියේ මෘදු පිටපත් සමාජ මාධ්‍ය ජාලවල සහ වෙනත් මාධ්‍ය ආයතනවල බෙදා හැරීම නිසා, එය මහජනතාව අතරට පැතිරී ගොස් ඇති බවත්, මෙම ලිපියේ අන්තර්ගතය තුළින් මාගේ සේවාදායකයා වන සුනිල් වටගල මහතා අපහාසාත්මක ලෙස චිත්‍රණය කර ඇති අතර, ඔහුව අවිශ්වාසනීය සහ අසත්‍ය ප්‍රකාශකරුවෙකු ලෙස මහජනතාවගේ ඇසට හසුකර ඇති බවත්ය.

15. මා වෙත ලැබී ඇති උපදෙස් මත ප්‍රකාශ කර සිටින්නේ, ඔබගේ 2025 සැප්තැම්බර් මස 10 වන දින දරණ එන්තරවාසියට ප්‍රචාරණයක් ලබාදීම මගින් මාගේ සේවාදායකයාට අපහාසයක් සිදුවී ඇති බවත්, මාගේ සේවාදායකයාගේ කීර්ති නාමයට හානියක් සිදුවී ඇති බවත්, එසේ සිදුවී ඇති සමස්ත හානිය රුපියල් බිලියන 2(රු.2,000,000,000/-) ක මුදලකට තක්සේරු කර ඇති බවත්ය.

16. ඒ අනුව, මා වෙත ලැබී ඇති උපදෙස් මත ප්‍රකාශ කර සිටින්නේ, ඔබගේ 2025 සැප්තැම්බර් මස 10 වන දින දරණ එන්තරවාසියේ ප්‍රචාරණය නිසා සිදුවූ මෙම හානිය පූරණය කිරීම සඳහා, රුපියල් බිලියන 2 (රු.2,000,000,000/-) ක මුදල මෙම එන්තරවාසියේ දින පටන් දින 07 ක් ඇතුළත මාගේ සේවාදායකයා හට ගෙවන ලෙස මෙයින් දන්වා සිටින අතර, එකී මුදල් ඔබ විසින් මෙම එන්තරවාසියේ දින පටන් දින 07 ක් ඇතුළත ගෙවීමට අපොහොසත් වුවහොත්, එකී මුදල ඔබගෙන් අය කර ගැනීමට ද, නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, වෙනත් ආනුශාංගික ප්‍රදානය කරවා ගැනීමට ද, නිසි සිවිල් අධිකරණයක ඔබට විරුද්ධව නඩු පැවරීමට මා වෙත උපදෙස් ලැබී ඇති බව ද මෙයින් දන්වා සිටිමි.

මෙයට විශ්වාසී,

MANJULA BALASOORIYA
Attorney-at-Law,
Notary Public, Commissioner For Oaths
& Registered Company Secretary
No.41,2nd Floor, Belmont Street,
Colombo-12. Tel:0714 853653

[1] https://www.itnnews.lk/2025/02/18/665666/
[2] https://www.bbc.com/sinhala/world-38917896
[3] https://lankatimes.lk/a-secret-police-investigation-about-namals-lawyer-post/



Scanned with CamScanner